ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | **ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව** |
| දිනය | **2016 ජුලි මස 1 වැනි දින** |

## 2016 මාර්තු මාසයේ දී විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය

**සමස්ත නිරීක්ෂණ**

2016 මාර්තු මාසයේ දී වෙළඳ හිඟය පුළුල් වීමත් සමඟ විදේශීය අංශය මධ්‍යස්ථ ක්‍රියාකාරීත්වයක් පෙන්වීය. 2016 මාර්තු මාසයේ දී පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව අපනයන ඉපැයුම් අඩු වූ අතර, ආනයන වියදම් සුළු වශයෙන් අඩු විය. කෙසේ නමුත්, අපනයන ඉපැයුම් අඩුවීමට වඩා වැඩි අගයකින් ආනයන වියදම් අඩුවීම හේතුවෙන් 2016 පළමු කාර්තුව තුළ දී වෙළඳ හිඟය පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව අඩු විය. ගෙවුම් ශේෂයෙහි ජංගම ගිණුම ශක්තිමත් කරමින් සංචාරක ඉපැයුම් සහ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ වර්ධනය වූ අතර, මූල්‍ය ගිණුම වෙත වූ ලැබීම් තවදුරටත් මධ්‍යස්ථ මට්ටමක පැවතුණි.

**අපනයන ක්‍රියාකාරිත්වය**

2015 මාර්තු මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 1,065 ක් ලෙස වාර්තා වූ එම වසරේ ඉහළම මාසික අපනයන ආදායමට සාපේක්ෂව 2016 මාර්තු මාසයේ දී අපනයන ආදායම එ.ජ. ඩොලර් මිලියන 945 ක් දක්වා සියයට 11.2 කින් අඩු විය. මෙම අඩුවීම සඳහා විශාලතම දායකත්වය ප්‍රවාහන උපකරණ මගින් ලැබුණු අතර, අනතුරුව කුළුබඩු අපනයන මේ සඳහා දායක විය. ප්‍රවාහන උපකරණ අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 76.6 කින් අඩු වූ අතර, 2014 වසරේ දී වරාය නගර සංවර්ධන ව්‍යාපෘතියෙහි කැනීම් කටයුතු සඳහා ආනයනය කරන ලද යාත්‍රාවක් 2015 මාර්තු මාසයේ දී අපනයනය කිරීම හේතුවෙන් ප්‍රවාහන උපකරණ අපනයන ආදායම එම මාසයේ දී සැලකිය

යුතු ලෙස ඉහළ යෑම මෙම අඩුවීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. 2015 වසරේ අවසාන භාගයේ සිට පැවති අඩුවීමේ ප්‍රවණතාවය තවදුරටත් පෙන්නුම් කරමින් 2016 වසරේ මාර්තු මාසයේ දී කුළුබඩු අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 37.7 කින් පහත වැටුණු අතර, මේ සඳහා අස්වැන්න අඩුවීම හේතුවෙන් කරාබුනැටි සහ ගම්මිරිස් අපනයනයේ සිදුවූ සැලකිය යුතු අඩුවීම හේතු විය. විශේෂයෙන්ම රුසියාව සහ මැදපෙරදිග රටවල් වැනි ප්‍රධාන තේ ආනයනකරුවන්ගෙන් පැවති ඉල්ලුමෙහි අඩුවීම තවදුරටත් පෙන්නුම් කරමින්, 2016 මාර්තු මාසයේ දී තේ අපනයන ආදායම සියයට 0.6 කින් සුළු වශයෙන් අඩු විය. එසේ වුවද, ඇමෙරිකා එක්සත් ජනපදය සහ සාම්ප්‍රදායික නොවන වෙළඳපොළ වෙත සිදු කරනු ලබන ඇඟලුම් අපනයනයේ වැඩිවීමක් පිළිබිඹු කරමින්, 2016 මාර්තු මාසයේ දී, මුළු අපනයන ආදායමෙන් සියයට 46.7 ක් වන රෙදිපිළි හා ඇඟලුම් අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 442 ක් දක්වා සියයට 3.2 කින් වැඩි විය.

සමුච්චිත වශයෙන් සැලකූ විට, ප්‍රවාහන උපකරණ සහ ඛනිජතෙල් නිෂ්පාදිත අපනයනයේ අඩු ක්‍රියාකාරිත්වය පිළිබිඹු කරමින් 2016 වසරේ පළමු මාස තුන තුළ දී අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 2,728 ක් දක්වා සියයට 5.4 කින් අඩු විය. 2016 වසරේ පළමු මාස තුන තුළ දී ඇමෙරිකා එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, ඉන්දියාව, ජර්මනිය සහ ඉතාලිය ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන වෙළඳපොළවල් ලෙස පැවති අතර, ඒ සඳහා කරන ලද අපනයන මුළු අපනයනයෙන් සියයට 54 ක් පමණ විය.

## සංඛ්‍යා සටහන 1: අපනයන ආදායම

| කාණ්ඩය | 2015 මාර්තු (එ.ජ.ඩො. මිලියන) | 2016 මාර්තු (එ.ජ.ඩො. මිලියන) | වෙනස (සියයට) | 2015 ජන-මාර්තු (එ.ජ.ඩො. මිලියන) | 2016 ජන-මාර්තු (එ.ජ.ඩො. මිලියන) | වෙනස (සියයට) |
|---|---|---|---|---|---|---|
| **1. කාර්මික අපනයන** | **845.7** | **740.4** | **(12.5)** | **2,251.5** | **2,154.4** | **(4.3)** |
| රෙදිපිළි හා ඇඟලුම් | 428.2 | 441.8 | 3.2 | 1,258.0 | 1,369.3 | 8.9 |
| රබර් නිෂ්පාදිත | 76.1 | 71.6 | (5.9) | 207.8 | 203.2 | (2.2) |
| ප්‍රවාහන උපකරණ | 152.8 | 35.7 | (76.6) | 165.4 | 47.0 | (71.6) |
| ආහාර, පාන වර්ග සහ දුම්කොළ | 24.8 | 29.0 | 17.2 | 66.9 | 81.4 | 21.8 |
| ඛනිජතෙල් නිෂ්පාදිත | 25.1 | 27.1 | 8.2 | 127.9 | 74.2 | (42.0) |
| මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 28.2 | 19.7 | (30.1) | 109.5 | 75.0 | (31.5) |
| සත්ත්ව ආහාර | 7.5 | 5.7 | (23.5) | 20.1 | 18.2 | (9.5) |
| වෙනත් | 103.0 | 109.7 | 6.5 | 296.0 | 286.1 | (3.4) |
| **2. කෘෂිකාර්මික අපනයන** | **214.1** | **200.7** | **(6.3)** | **618.9** | **562.2** | **(9.2)** |
| තේ | 113.4 | 112.7 | (0.6) | 335.3 | 313.1 | (6.6) |
| පොල් | 32.2 | 35.1 | 9.1 | 82.1 | 87.8 | 6.8 |
| කුළුබඩු | 28.9 | 18.0 | (37.7) | 90.8 | 60.9 | (33.0) |
| මුහුදු ආහාර | 15.7 | 16.5 | 5.3 | 43.4 | 46.5 | 7.1 |
| සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත | 17.0 | 9.3 | (45.2) | 43.6 | 28.1 | (35.5) |
| සකස් නොකළ දුම්කොළ | 2.1 | 3.3 | 55.4 | 8.6 | 9.2 | 7.2 |
| වෙනත් | 4.8 | 5.7 | 18.4 | 15.0 | 16.6 | 10.9 |
| **3. ඛනිජ හා වෙනත් අපනයන** | **4.9** | **4.3** | **(12.0)** | **14.0** | **11.4** | **(18.7)** |
| **මුළු අපනයන** | **1,064.7** | **945.4** | **(11.2)** | **2,884.4** | **2,728.0** | **(5.4)** |

මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා අනෙකුත් ඛනිජ තෙල් අපනයනකරුවන්
ශ්‍රී ලංකා මහ බැංකුව

### ආනයන ක්‍රියාකාරිත්වය

අඛණ්ඩව නවවන මාසයටත් අඩුවීමක් පෙන්නුම් කරමින් 2016 මාර්තු මාසයේ ආනයන වියදම එ.ජ.ඩොලර් මිලියන 1,566 ක් දක්වා පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 0.9 කින් සුළු වශයෙන් පහත වැටුණි. ආයෝජන භාණ්ඩ යටතේ වර්ගීකරණය කර ඇති ප්‍රවාහන උපකරණ, පාරිභෝගික භාණ්ඩ යටතේ වර්ගීකරණය කර ඇති පෞද්ගලික මෝටර් රථ වාහන සහ අන්තර් භාණ්ඩ යටතේ වර්ගීකරණය කර ඇති තිරිඟු සහ ඉරිඟු ආනයන වියදම්වල වාර්තා වූ පහළ යෑම ආනයන වියදමේ මෙම පහත වැටීම කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතු විය. වාහන ආනයනය අඩු කිරීමට රජය විසින් ගන්නා ලද ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවල බලපෑම පිළිබිඹු කරමින් පසුගිය වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව ප්‍රවාහන උපකරණ සහ පෞද්ගලික මෝටර් රථ වාහන ආනයන වියදම් පිළිවෙළින් සියයට 61.6 කින් සහ සියයට 39.4 කින් අඩු විය. ඒ අනුව,

මෝටර් කාර්, මෝටර් බයිසිකල්, කුලී රථ, බස් රථ, ලොරි සහ ත්‍රීරෝද රථ වැනි මෝටර් රථ වාහන ආනයනය මෙම මාසය තුළ දී සැලකිය යුතු ලෙස පහත වැටුණි. සාමාන්‍ය ආනයන මිලෙහි වැඩිවීමක් වාර්තා වුව ද, 2016 මාර්තු මාසය තුළ දී ප්‍රීමා ලංකා පෞද්ගලික සමාගම විසින් තිරිඟු ආනයනය නොකිරීම හේතුවෙන් තිරිඟු හා ඉරිඟු ආනයන වියදම සියයට 97.6 කින් සැලකිය යුතු ලෙස පහත වැටුණි. තවද, රත්‍රං, පොහොර, සකස් නොකළ දුම්කොළ සහ සහල් ආනයන සඳහා වූ වියදම ද මෙම මාසය තුළ දී සැලකිය යුතු ලෙස පහත වැටුණි. කෙසේ වුව ද, අනාගත ආර්ථික ක්‍රියාකාරකම්වල සිදු විය හැකි වර්ධනය පෙන්නුම් කරමින් යන්ත්‍රසූත්‍ර සහ උපකරණ, ගොඩනැගිලි ද්‍රව්‍ය සහ රෙදිපිළි හා රෙදිපිළි උපාංග ආනයන වියදම් පසුගිය වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව පිළිවෙළින් සියයට 43.2 කින්, සියයට 47.4 කින් සහ සියයට 25.7 කින් ඉහළ ගියේය. මේ අතර, 2014 නොවැම්බර් මාසයේ සිට අඛණ්ඩව පැවති පෙර වසරේ අදාළ මාසයන්ට සාපේක්ෂව ආනයන වියදම අඩු වීමේ ප්‍රවණතාවයට වෙනස්ව යමින් 2016 මාර්තු මාසයේ දී ඉන්ධන ආනයන වියදම සියයට 4.2 කින් ඉහළ ගිය අතර, 2015 මාර්තු මාසයේ දී බොර තෙල් ආනයනය නොකිරීම සහ පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව ගල්අඟුරු ආනයන වියදම සියයට 4.8 කින් ඉහළ යෑම, මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. තවද මුහුදු ආහාර, බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත, ගෘහ උපකරණ සහ සන්නිවේදන උපකරණ ආනයන වියදම ද මෙම මාසය තුළ දී ඉහළ ගියේය.

සමුච්චිත වශයෙන් සැලකූ විට, 2016 වසරේ පළමු මාස තුන තුළ දී ආනයන වියදම එ.ජ.ඩොලර් මිලියන 4,594 ක් දක්වා සියයට 4.1 කින් පහත වැටුණු අතර, ඉන්ධන ආනයන වියදමෙහි වාර්තා වූ පහළ යෑම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. මෙම කාලය තුළ දී ඉන්ධන නොවන ආනයන වියදම එ.ජ.ඩොලර් මිලියන 4,109 ක් දක්වා සියයට 0.6 කින් වර්ධනය විය. 2016 වසරේ පළමු මාස තුන තුළ දී චීනය, ඉන්දියාව, ජපානය, සිංගප්පූරුව සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යය ප්‍රධාන ආනයන ප්‍රභවයන් වූ අතර, මෙම රටවල් සමගින් සිදු කළ ආනයන සමස්ත ආනයනයන්ගෙන් සියයට 57 ක් පමණ විය.

## සංඛ්‍යා සටහන 2: ආනයන වියදම

| කාණ්ඩය | 2015 මාර්තු (එ.ජ.ඩො. මිලියන) | 2016 මාර්තු (එ.ජ.ඩො. මිලියන) | වෙනස (සියයට) | 2015 ජන-මාර්තු (එ.ජ.ඩො. මිලියන) | 2016 ජන-මාර්තු (එ.ජ.ඩො. මිලියන) | වෙනස (සියයට) |
|---|---|---|---|---|---|---|
| **1. පාරිභෝගික භාණ්ඩ** | **441.6** | **420.1** | **(4.9)** | **1,191.3** | **1,109.2** | **(6.9)** |
| ආහාර හා පාන වර්ග | 147.3 | 158.3 | 7.4 | 462.8 | 399.5 | (13.7) |
| එළවළු | 34.8 | 39.8 | 14.6 | 108.1 | 121.7 | 12.5 |
| මුහුදු ආහාර | 15.9 | 25.5 | 60.4 | 44.9 | 60.7 | 35.1 |
| කිරි නිෂ්පාදිත | 21.7 | 18.8 | (13.3) | 59.7 | 56.7 | (5.0) |
| ධාන්‍ය හා ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 9.0 | 1.9 | (79.3) | 84.8 | 5.0 | (94.1) |
| වෙනත් ආහාර හා පාන වර්ග | 66.0 | 72.3 | 9.6 | 165.3 | 155.4 | (6.0) |
| අනෙකුත් පාරිභෝගික භාණ්ඩ | 294.2 | 261.8 | (11.0) | 728.5 | 709.7 | (2.6) |
| බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත | 40.0 | 47.4 | 18.5 | 110.1 | 131.3 | 19.2 |
| වාහන | 132.3 | 80.2 | (39.4) | 290.5 | 231.6 | (20.3) |
| වෙනත් ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | 121.9 | 134.2 | 10.1 | 327.9 | 346.8 | 5.8 |
| **2. අන්තර් භාණ්ඩ** | **741.0** | **715.2** | **(3.5)** | **2,397.0** | **2,240.3** | **(6.5)** |
| රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 177.0 | 222.6 | 25.7 | 588.1 | 698.5 | 18.8 |
| ඉන්ධන | 155.5 | 162.1 | 4.2 | 709.1 | 485.7 | (31.5) |
| දියමන්ති සහ  අගනා ගල් හා ලෝහ වර්ග | 30.7 | 17.3 | (43.6) | 56.7 | 80.8 | 42.5 |
| පොහොර | 24.8 | 12.8 | (48.2) | 54.7 | 41.1 | (25.0) |
| තිරිඟු හා ඉරිඟු | 52.5 | 1.3 | (97.6) | 76.8 | 54.5 | (29.1) |
| වෙනත් | 300.6 | 299.2 | (0.5) | 911.4 | 879.8 | (3.5) |
| **3. ආයෝජන භාණ්ඩ** | **397.5** | **430.2** | **8.2** | **1,201.7** | **1,243.5** | **3.5** |
| යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 172.3 | 246.7 | 43.2 | 586.3 | 712.4 | 21.5 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 88.7 | 130.7 | 47.4 | 316.0 | 371.6 | 17.6 |
| ප්‍රවාහන උපකරණ | 136.3 | 52.3 | (61.6) | 297.8 | 157.7 | (47.0) |
| වෙනත් | 0.3 | 0.5 | 64.5 | 1.7 | 1.9 | 13.2 |
| **4. වර්ග නොකළ ආනයන** | **0.8** | **0.5** | **(37.6)** | **2.1** | **1.3** | **(36.5)** |
| **මුළු ආනයන** | **1,580.9** | **1,566.0** | **(0.9)** | **4,792.1** | **4,594.5** | **(4.1)** |

මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
ලංකා අයි.ඕ.සී. සමාගම
ශ්‍රී ලංකා මහ බැංකුව

## රූප සටහන 1: අපනයන සහ ආනයන ක්‍රියාකාරිත්වය







### වෙළඳ ශේෂය

වෙළඳ ගිණුමේ හිඟය 2015 වසරේ මාර්තු මාසයේ දී වාර්තා වූ එ.ජ.ඩොලර් මිලියන 516 ට සාපේක්ෂව 2016 වසරේ මාර්තු මාසයේ දී එ.ජ.ඩොලර් මිලියන 621 ක් දක්වා සියයට 20.2 කින් ප්‍රසාරණය විය. කෙසේ වුවද, සමුච්චිත වශයෙන් සැලකූ විට 2015 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී එ.ජ.ඩොලර් මිලියන 1,908 ක් වූ වෙළඳ හිඟය 2016 වසරේ පළමු මාස තුන තුළ දී එ.ජ.ඩොලර් මිලියන 1,867 ක් දක්වා සියයට 2.2 කින් පහත වැටුණි.

### සංචාරක ඉපැයීම්

2016 අප්‍රේල් මාසයේ දී 136,367 ක පැමිණීම් සංඛ්‍යාවක් සමඟින් සංචාරක පැමිණීම් පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 11.6 ක වර්ධනයක් වාර්තා කරමින් සිය වර්ධන ප්‍රවණතාව අඛණ්ඩව පවත්වා ගත්තේය. ඒ අනුව, 2016 වසරේ පළමු මාස හතර තුළ වූ සමුච්චිත සංචාරක පැමිණීම් 2015 වසරේ අනුරූප කාල පරිච්ඡේදය සමඟ සැසඳීමේ දී 721,185 ක් දක්වා සියයට 20.0 කින් වර්ධනය විය. ඉන්දියාව, චීනය, එක්සත් රාජධානිය, ජර්මනිය සහ ප්‍රංශය 2016 වසරේ අප්‍රේල් මාසයේ දී සංචාරකයින් පැමිණීමේ ප්‍රධාන රටවල් පහ වූ අතර, මුළු සංචාරක පැමිණීම්වලින් සියයට 53.1 කට දායක විය. 2016 වසරේ පළමු මාස හතර තුළ සමුච්චිත සංචාරක ඉපැයීම්[1] පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 996.2 ට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 1,195.3 ක් දක්වා වර්ධනය විය.

[1] සංචාරක ඉපැයීම් තාවකාලික ඇස්තමේන්තු වන අතර, 2016 වසර සඳහා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන අධිකාරිය විසින් නිකුත් කරනු ලබන ඇස්තමේන්තුගත සාමාන්‍ය දෛනික වියදම සහ සංචාරකයකු මෙරට ගත කරන සාමාන්‍ය කාලසීමාව පිළිබඳව සිදු කෙරෙන සමීක්ෂණයේ වාර්තාව අනුව සංශෝධනය විය හැකිය.

**විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ**

2016 මාර්තු මාසයේ දී විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ ලැබීම් 2015 මාර්තු මාසයේ දී වාර්තා කළ එ.ජ. ඩොලර් මිලියන 644.3 ක සිට එ.ජ. ඩොලර් මිලියන 675.7 ක් දක්වා සියයට 4.9 කින් වර්ධනය විය. 2016 පළමු කාර්තුවේ දී විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණයන්හි සමුච්චිත ලැබීම් 2015 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 1,793.4 ක් දක්වා සියයට 6.8 කින් වර්ධනය විය.

**මූල්‍ය ලැබීම්**

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි සමාගම් ලබාගත් ණය ද ඇතුළත් මුළු විදේශීය සෘජු ආයෝජන 2015 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 346.4 සමඟ සැසඳීමේ දී 2016 වසරේ පළමු කාර්තුවේ දී එ.ජ. ඩොලර් මිලියන 164.5 ක් විය. මේ අතර, කොළඹ කොටස් වෙළඳපොළෙහි විදේශීය ආයෝජන 2016 මාර්තු මස අවසානය දක්වා කාලය තුළ එ.ජ. ඩොලර් මිලියන 12.5 ක ශුද්ධ ගෙවීමක් වාර්තා කළ අතර, එය ද්විතීයික වෙළඳපොළ වෙත වූ එ.ජ. ඩොලර් මිලියන 13.8 ක ශුද්ධ ගෙවීමකින් සහ ප්‍රාථමික වෙළඳපොළ වෙත වූ එ.ජ. ඩොලර් මිලියන 1.3 ක ලැබීම්වලින් සමන්විත විය. රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙත වූ ආයෝජන 2015 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 15.4 ක ශුද්ධ ගෙවීම සමඟ සැසඳීමේ දී 2016 වසරේ පළමු කාර්තුවේ දී එ.ජ. ඩොලර් මිලියන 572.3 ක ශුද්ධ ගෙවීමක් විය. රජය වෙත වූ දිගුකාලීන ණය 2015 වසරේ පළමු කාර්තුව තුළ වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 4.5 ක ශුද්ධ ලැබීම සමඟ සැසඳීමේ දී 2016 වසරේ පළමු කාර්තුව තුළ දී එ.ජ. ඩොලර් මිලියන 116.1 ක ශුද්ධ ගෙවීමක් වාර්තා කළේය.

ඉන්දියානු සංචිත බැංකුව සමඟ වූ එ.ජ. ඩොලර් මිලියන 1,100 ක විදේශීය විනිමය හුවමාරු පහසුකම 2016 මාර්තු මස 8 වන දින පියවන ලදී. කෙසේ නමුත්, මාර්තු මස 8 වන දින ශ්‍රී ලංකාව සාර්ක් මූල්‍ය විදේශ විනිමය හුවමාරු ගිවිසුම යටතේ එ.ජ. ඩොලර් මිලියන 400 ක් ද, 2016 මාර්තු මස අගදී ඉන්දියානු සංචිත බැංකුව සමඟ ඇතිකරගත් තවත් විදේශීය විනිමය හුවමාරු ගිවිසුමක් තුළින් එ.ජ. ඩොලර් මිලියන 700 ක් ද ලද අතර, එම ඩොලර් මිලියන 700, 2016 ජුනි මාසයේ දී පියවන ලදී.

**ගෙවුම් තුලනයේ සමස්ත තත්ත්වය**

2016 පළමු කාර්තුව තුළ දී ගෙවුම් තුලනය 2015 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී වාර්තා කළ එ.ජ. ඩොලර් මිලියන 1,016.8 ක හිඟයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 720.2 ක හිඟයක් වාර්තා කරනු ඇතැයි ඇස්තමේන්තු කර ඇත.

**ජාත්‍යන්තර සංචිත සහ විනිමය අනුපාතිකයේ හැසිරීම**

2016 මාර්තු මස අග වනවිට ශ්‍රී ලංකාවේ දළ නිල සංචිත ආනයනික මාස 4.0 කට සමාන වන පරිදි එ.ජ. ඩොලර් බිලියන 6.2 ක් වූ අතර, මුළු විදේශීය වත්කම් ආනයනික මාස 5.3 කට සමාන වන පරිදි එ.ජ. ඩොලර් බිලියන 8.2 ක් විය.

2015 අග සිට 2016 ජුනි මස 30 වන දින දක්වා කාලපරිච්ඡේදය තුළ ශ්‍රී ලංකා රුපියල, එ.ජ. ඩොලරයට එරෙහිව සියයට 0.8 කින් සුළු වශයෙන් අවප්‍රමාණය විය. තවද, අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වල විනිමය අනුපාතික හැසිරීම මත පදනම්ව මෙම කාලපරිච්ඡේදය තුළ දී ශ්‍රී ලංකා රුපියල යුරෝවලට එරෙහිව සියයට 2.5 කින් ද, ජපන් යෙන්වලට එරෙහිව සියයට 15.4 කින් ද, කැනේඩියානු ඩොලරයට එරෙහිව සියයට 7.4 කින් සහ ඕස්ට්‍රේලියානු ඩොලරයට එරෙහිව සියයට 2.8 කින් අවප්‍රමාණය වූ අතර, ස්ටර්ලින් පවුමට එරෙහිව සියයට 9.6 කින් සහ ඉන්දියානු රුපියලට එරෙහිව සියයට 0.7 කින් අධිප්‍රමාණය විය.

**සංඛ්‍යා සටහන 3: විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වයෙහි සාරාංශය (අ)**

| කාණ්ඩය | 2015 මාර්තු (එ.ජ.ඩො. මිලියන) | 2016 මාර්තු (එ.ජ.ඩො. මිලියන) | වෙනස (සියයට) | 2015 ජන-මාර්තු (එ.ජ.ඩො. මිලියන) | 2016 ජන-මාර්තු (එ.ජ.ඩො. මිලියන) | වෙනස (සියයට) |
|---|---|---|---|---|---|---|
| අපනයන | 1,064.7 | 945.4 | -11.2 | 2,884.4 | 2,728.0 | -5.4 |
| ආනයන | 1,580.9 | 1,566.0 | -0.9 | 4,792.1 | 4,594.5 | -4.1 |
| වෙළඳ ශේෂය (අතිරික්තය (+)/හිඟය (-)) | -516.2 | -620.7 | 20.2 | -1,907.7 | -1,866.5 | -2.2 |
| සංචාරක ඉපැයීම් | 260.3(ආ) | 319.6 | 22.8 | 793.6(ආ) | 969.3 | 22.1 |
| විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ | 644.3 | 675.7(ආ) | 4.9 | 1,679.4 | 1,793.4(ආ) | 6.8 |
| කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ ලැබීම් (ශුද්ධ) (ඇ) | 10.5 | -2.4 | -122.8 | 38.6 | -12.5 | -132.4 |
| රාජ්‍ය අංශයේ ලැබීම් (ඈ) එයින්, | 246.3 | 112.1 | -54.5 | 612.1 | 253.6 | -58.6 |
| භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර | 158.3 | 20.4 | -87.1 | 348.7 | 43.3 | -87.6 |
| ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර | - | - | - | - | - | - |
| දිගුකාලීන ණය | 80.0 | 91.1 | 13.9 | 238.2 | 205.0 | -14.0 |
| විදේශීය සෘජු ආයෝජන (ඉ) | - | - | - | 346.4 | 164.5 | -52.5 |

මූලයන්: ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය
ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය
කොළඹ කොටස් වෙළඳපොළ
ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික

(ආ) සංශෝධිත

(ඇ) ප්‍රාථමික සහ ද්විතියික වෙළඳපොළ ගනුදෙනු ඇතුළත් වේ.

(ඈ) රජයට ලැබුණු ප්‍රාග්ධන සහ ජංගම සංක්‍රාම, භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර මත විදේශ ආයෝජකයන් විසින් කරන ලද ආයෝජන, ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර සහ රජයට ලැබුණු දිගුකාලීන ණය යනාදිය රාජ්‍ය අංශයේ ලැබීම් තුළ ඇතුළත් වේ.

(ඉ) දත්ත පවතිනුයේ පළමු මාස 3 සඳහා වන අතර, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් වාර්තා කළ පරිදි සෘජු ආයෝජන සමාගම් වෙත වූ විදේශීය ණය ඇතුළත් වේ.